මහනුවර යුගයේ බිතු සිතුවම්

ප්‍රාදේශික ශෛලි — සබරගමුව (1)

සිරි ගුනසිංහ

සබරගමුව[1] ඓතිහාසික වශයෙන් බෙහෙවින් පැරණි ප්‍රදේශයක් බව සාමාන්‍යයෙන් කල්පනාවට භාජන නොවෙයි. සබරගමුව යන නම පවා බොහෝ විට හඟවන්නේ එය වැද්දන් ජීවත් වූ ප්‍රදේශයක් බවයි.[2] ඒ අදහස සැබෑ නම් ලංකාවේ අනික් ප්‍රදේශ — අනුරාධපුරය, මාගම — ශිෂ්ට මිනිසුන්ගේ වාසය වී තිබිය දී සබරගමුව මහා වනාන්තරයක් වී තිබිනැයි එයින් නිගමනය වේ. එහෙත් සත්‍යය එය නොවේ. සබරගමුවේ නොයෙක් නොයෙක් තැන්වලින් දැනට සොයාගෙන ඇති පුරා විද්‍යාත්මක වස්තු හා ඓතිහාසික ලිපි ලේඛනාදිය ගැන සිතන විට පෙනී යන්නේ අනුරාධපුරය හා මාගම ජනාකීර්ණ රාජධානි වී තුබූ කාලයෙහි ම සබරගමුවේ සමහර ප්‍රදේශ ද ජනාකීර්ණ වී තුබුණු බව යි. බුදුගල, කුරගල, දියඉන්න, කොට්ටිඹුල්වල, සංඛපාල විහාරය ආදිය ඉන් සමහරකි. කුරගල, සෙල්ලිපිය දෙවගිරි, විහාරේ ගල්ගේ සෙල්ලිපිය, සංඛපාල විහාර සෙල්ලිපිය ආදිය මේ පිළිබඳ ඉතාමත් වැදගත් ලේඛන යැයි කිය හැක. මේ ශිලාලේඛන සියල්ලක් ම ලියා ඇත්තේ ක්‍රිස්තු පූර්ව දෙවෙනි හෝ පළමුවෙනි ශත වර්ෂවල භාවිතා වුනු අකුරින් ය යනු පිලිගත් මතය යි. ශිලා ලේඛන ලියා ඇති බ්‍රාහ්මී අක්ෂර පමනක් නොව ''පුත පුස දෙවස ලෙනෙ සගස'' .....හ ලෙණෙ අගත අනගත චතුදිස සගස'' ''පරුමක උතර ගුත පුතන පරුමක චුලහ ඔතකසබහ'' ආදියෙහි ඇති වචන හා භාෂා ව්‍යවහාරයන් ඒ යුගයට ම අපේ සිත් යොමු කරවන බව විශෙෂයෙන් සඳහන් කල යුතු නැත. ඉතා ඈත අතීතයේ සිට ශ්‍රී පාදස්ථානය පූජාභූමියක් වී තුබුනු බව මහාවංශයේ[3] සඳහන් වෙයි. සබරගමුව ආගමික

1. සබරගමුව යන්නෙන් මේ ලිපියෙහි හැඳින්වෙන්නේ මුළු සබරගමු පලාතම නොවේ. බිතු සිතුවම් ගැන සිතීමේ දී සබරගමු පලාතට අයිතිවුවත් කෑගල්ල දිස්ත්‍රික්කය වෙන්කොට ගත යුතු යැයි අපට හැඟේ. එහෙයින් මේ ලිපිය රත්නපුර දිස්ත්‍රික්කයට පමනක් සීමා කරමු.
2. සබර යන්න වැද්දන් හඳුන්වන පර්යාය ශබ්දයක් යැයි පිලිගෙන ඇත. එහෙත් සබරගමු යන්නෙහි සැබෑ තේරුම මෙතෙක් නිශ්චය කරගත් බවක් කිව නොහැක.
3. මහාවංශ, 60



ඔමල්පේ
විහාරයක
බිතුසිතුවම්



වශයෙන් වැදගත් ප්‍රදේශයක් වීමට ප්‍රධාන හේතුවක් වූයේ ශ්‍රී පාද ස්ථානයේ පිහිටීම විය හැක. කෙසේ වුවත් මාගම ප්‍රධාන රාජධානියක්ව පැවැති සමයක රුහුණු රටට අයත් සබරගමුවේ නොයෙක් නොයෙක් තැන්වල විහාරාරාම ඇතිවීම පුදුමයට කාරනයක් විය නොහැක. ඒ යුගයේ ජනප්‍රියවී තිබුනු විහාරාරාමවල නටබුන් පිළිබඳව විස්තරයක් කිරීමට අපි අදහස් නොකරමු. ඒ ගැන සිත් යොමු කලේ සබරගමුව බෞද්ධ කලාව අතින් වැදගත් ප්‍රදේශයක් බව සිහිකිරීම පිණිස පමනි.

සබරගමුවේ බිතු සිතුවම් ගැන සඳහන් කිරීමේ දී අපේ සැලකිල්ලට භාජන විය යුත්තේ මාගම් යුගය නොව මහනුවර රාජධානියුගයයි. අනුරාධපුර පොලොන්නරු රාජධානි සමයෙහි සබරගමුව ආගමික වශයෙන් කොයි තරම් දියුනු තත්වයක තිබුනා ද යන්න ගැන කිසිවක් කීම අපහසු ය. අනුරාධපුර පොලොන්නරු කාලවල රුහුනු රට ක්‍රමක්‍රමයෙන් අගයෙන් අඩු වී ගිය බව නොරහසකි. මාගම ප්‍රධාන රාජධානියක් වී තුබුනු බවට සාධක මහාවංශයේ වත් දිටිය නොහැක. මාගම අනුරාධපුරයට යටත් රාජධානියක් පමනක් විය. ඒ නිසා කල්යැමේ දී මාගම් රාජ්‍යයට යටත් ප්‍රදෙශ අමතක වී යැම පුදුමයට කාරනයක් විය නොහැක. දැනට කැලැවෙන් වැසී ඇති වටිනා නටබුන් රාශිය මාගම් රාජ්‍යයේ උච්ච අවස්ථාවත්, එය පිරිහී යාමත් පිලිබිඹු කරන සංකේතය. මාගම් රාජ්‍යයේ දුරබැහැර මුල්ලක් මෙන් සිතිය යුතු සබරගමුව අමතක වී යැම ඒ නිසා කිසිසේත් ම අපූරු සිද්ධියක් හැටියට සිතිය යුතු නැත. මුල් යුගය අවසානයේ අගයෙන් පිරිහී ගිය සබරගමුව නැවතත් පැදෙන්න පටන් ගෙන තිබෙන්නේ සිංහල රාජධානිය පිහිටි රටින් බැහැර් වූවාට පසුව විය හැක. සිංහල රාජධානිය දඹදෙනිය, කෝට්ටේ, රයිගම ආදී ස්ථානවලට පැමිනීමත් සමග බස්නාහිර හා දකුනු දිග මුහුදු කරයත් ඒ හා සම්බන්ධ අභ්‍යන්තර ප්‍රදෙශත් වඩ වඩාත් එලි පෙහෙලි වී ජනාකීර්න වීම ස්වාභාවික ය. දේශපාලන හේතු, යුද්ධ කොලාහල හා වෙලහෙලදාම් අතින් මේ අවධියෙහි සබරගමුව වැදගත් ප්‍රදෙශයක් වූවාට සැකයක් නැත. සිංහල රාජ්‍යයේ අවසානය දක්වා ම සබරගමුව මේ තත්වය උසුලා ඇති බව ප්‍රදේශයේ නොයෙක් නොයෙක් තැන්වලින් සොයා ගත් පැරණි ලියකියවිලිවලින් අවබෝධ කරගත හැක.[4]


සිංහල රාජධානිය කෝට්ටේ වැනි තැන්වලට සම්ප්‍රාප්ත වීමත් සමග සබරගමු ප්‍රදේශය අගයෙන් වැඩි වූවත්, දැනට ඉතිරිවී ඇති වෙහෙර විහාරාදියත්, බිතිසිතුවම් ආදියත් ඒ තරම් පැරනි නැත. කෝට්ටේ රාජධානි යුගයට අයත්යැයි සිතිය හැකි නටබුන් සම්හර තැන්වල (ගනේගම රන්කොත් විහාරය) ඇතත් සබරගමුවේ ඇති බිතු සිතුවම් අතරින් පැරනිම සිතුවම් අයිති වන්නේ මහනුවර යුගයට යැයි කිය යුතුයි. වැලිවිට සරනංකර සංඝරාජ ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වය ඇතිව කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ රාජ්‍ය කාලයෙහි ලංකාවේ සෑම ප්‍රදෙශයක ම වාගේ බෞද්ධාගම පිලිබඳ නවෝදයක් ඇති වූ බව ප්‍රසිද්ධ ය. එතෙක් ජරාවාස වී නටබුන් වී තිබුනු වෙහෙර විහාර රාශියක් ම මේ රජතුමා විසින් අලුත්වැඩියා කොට වැදුම් පිදුම් කිරීමට සුදුසු වන සේ ප්‍රතිසංස්කරනය කරවන ලදී. මහනුවර අවට ප්‍රදෙශය පමනක් නොව කුරුනෑගල, අනුරාධපුරය, ඌව, වෙල්ලස්ස, බින්තැන්න ආදී හැම ප්‍රදෙශයක ම කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ ශාසනික කටයුතුවල ප්‍රතිඵලය දිටිය හැක. සබරගමුවෙහි දැනට ඉතිරිවී ඇති විහාරාරාම අලුත්වැඩියා කිරීම හෝ ඉදිකිරීම ආරම්භ වී ඇත්තේ ද මේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ රාජ්‍ය කාලයෙහි යැයි සිතීමට තුඩු දෙන ලිය කියවිලි එමට ඇත. එහෙත් ඒ රජතුමාගේ කාලයෙහි අඳින ලද බිතු සිතුවම් මෙතෙක් ඉතිරි වී ඇද්දැ යි සහතික වශයෙන් කිය නොහැක. සබරගමුවෙහි වෙහෙර විහාර පෘතුගීසීන් හා ඕලන්දක්කාරයින් විසින් නොයෙක් වර විනාශ කිරීම මෙයට හේතුවක් වශයෙන් සැලකිය යුතු ය. පෘතුගීසීන් හා ඕලන්දක්කාරයන් විසින් කොතෙක් දුරට මෙහි වෙහෙර විහාර විනාශ කරන ලද දැයි නිසැකයෙන් කීම දුෂ්කර ය. එහෙත් ඕලන්දක්කාරයින් විසින් ගිනිබත් කරනු ලැබූ වලල්ගොඩ විහාරය ඊට නිදසුනක් හැටියට සඳහන් කල හැක. යුද කරදර බහුලව තිබුනු කාලයේ නටබුන් වී ජරාවාස වී ගිය සමහර විහාර රාජාධි රාජසිංහ හා ශ්‍රී වික්‍රම රාජසිංහ යන රජවරුන් විසින් ද ප්‍රතිසංස්කරනය කරන ලදී. ඉතිරි වෙහෙර විහාර මහනුවර රජයේ ප්‍රාදේශික නිලධාරීන් හා ගම්මුන් විසින් ම අලුත්වැඩියා කරගන්නා ලදී.

කීර්ති ශ්‍රී රාජසිංහ කාලයේ හෝ ඊට පසුව හෝ නිම කරන ලද සබරගමුවේ බිතුසිතුවම්වලින් දැනට ඇත්තේ ඉතාමත් ස්වල්පයකි. විහාර ගෙවල් පැරනි නමුත් ඉන් බොහෝමයක ඇති සිතුවම් මෑත කාලයක කරන ලද ඒවා යැයි සැලකිය යුතු ය. පැරනි සිතුවම් දිරා ගොස් සායම් ගැලවී යාම් නිසාත් ඉටිපන්දම්, පොල්තෙල් පහන් හා හඳුන්කුරු ආදියේ දුමින් අඳුරු වී යැම නිසාත් මේ විහාර භාරකාර ස්වාමීන් වහන්සේලා හා ඒ පන්සල්වල දායකක්මි කරන පින්වතුන් ඒවා

4. පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල හිමි: සබරගමුවේ පැරණි ලියවිලි.



ඕමල්පේ
විහාරයක
බිතුසිතුවම්



වෙනුවට අලුත් සිතුවම් ඇන්දවීම පුදුමයට කෙසේ වෙතත් කනගාටුවට කාරනයකි. කෙසේ වෙතත් විහාර කීපයකවත් බිතු සිතුවම් ඉතිරි වී තිබීම නිසා සබරගමුවේ පැරනි බිතු සිතුවම් ගැන අපට සුලු වශයෙන් හෝ අවබෝධයක් ලබා ගත හැක.

මේ ස්ථාන කීපය අතර විශෙෂයෙන් සඳහන් කල යුත්තේ වලල්ගොඩ පැරනි විහාරය, ඕමල්පේ පැරනි විහාරය, කොට්ටිඹුල්වල රජමහා විහාරය, ගොඩකවෙල රජමහා විහාරය හා පැල්මඩුල්ලේ ශ්‍රී සුධර්මොදය පිරිවෙනත් ය.

වලල්ගොඩ[5] විහාරය සබරගමුවේ ඇති විහාර අතරින් බෙහෙවින් පැරනි විහාරයකි. දැනට, තිබෙන් විහාරය කෙසේ වෙතත්, මේ ස්ථානය මාගම් රාජධානි සමයෙහි සිට ම පූජ්‍ය ස්ථානයක් වී තිබිනැ යි සිතීමට තුඩු දෙන පැරනි නටබුන් එහි ඇත. මෙහි ඇති විහාරය අයත් වන්නේ මහනුවර රාජධානි සමයට ය. විහාරයේ සිතුවම් හා ගෘහනිර්මානය මහනුවර යුගයේ ප්‍රචලිතව තුබුනු ශෛලින්ට අනුකූල නිසාත් විහාරය හා සම්බන්ධ ලියකියවිලිවලින් ප්‍රකාශවෙන කරුනු අනුවත් මේ නිගමනයට බැසිය හැක. සියම් දෙශයෙන් උපසම්පදව ගෙන ආ උපාලි ස්ථවිරයන් විසින් වලල්ගොඩ සීමාවක් බඳවන ලදී.[6] වැලිවිට සහරාජ තුමාගේ හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ශාසනික කටයුතුවලට වලල්ගොඩ ද ඇතුලත් වූ බව සිතිය හැක්කේ මේ නිසා ය. මේ මතය තහවුරු කිරීමට අදල වන පූජා පත්‍ර කීපයක් ද මේ විහාරයේ ඇත.[7] ඒ ලියවිලිවලින් පෙනෙන හැටියට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ රාජ්‍ය කාලයෙහි වලල්ගොඩ විහාරය වැදගත් ස්ථානයක් වී තිබුනු නමුත් ඒ රජතුමා විසින් ම එහි ප්‍රතිසංස්කරන වැඩ කරවන ලද බවක් සඳහන් වී නැත. ඒ ලිපිවලින් නිගමනය කල හැක්කේ විහාරයේ වැඩ කටයුතු ප්‍රදෙශයේ ප්‍රධානීන් හා ගම්මුන් විසින් ම කරන ලද බව යි. රජතුමාගේ ම දයකත්වය ලැබීමට තරම් මේ විහාර වැදගත් නොවීම පුදුමයට කාරනයක් නොවේ. රජතුමාගේ අවධානයට යොමු වූයේ මහනුවර නගරාසන්න විහාර හා වැදගත් ප්‍රාදෙශික විහාර ආරාම පමනකි. කුඩා ප්‍රාදෙශික විහාරාරාමවලට දයක කම් ඒ ඒ ගම්වාසීන්ම පමනකි. මේ නිසා ගඩලාදෙනිය, ලංකා තිලකය, දෙගල්දෙරුව වැනි විහාරවල ඇති, විශිෂ්ට බව වලල්ගොඩ වැනි කුඩා විහාරවල දිටිය නොහැක. එහෙත් ඒවායේ ඇති බිතු සිතුවම් අගයෙන් අඩු නොවේ. ලන්දේසීන් විසින් වලල්ගොඩ ආරාමය ගිනිබත් කල නමුත් වාසනාවකට මෙන් විහාරය සහමුලින් ම ද නොගොස් ඉතිරි වී ඇත. විහාරයත් ගිනිගත් බවට සලකුනු තවමත් දක්ක හැක. ලන්දේසීන්ගේ අතවරයෙන් පසු විහාරය ප්‍රතිසංස්කරනය නොකල බවට මේ සලකුනු සාධක වශයෙන් ගත යුතු ය. කෙසේ වෙතත් එයින් පසු බිතු සිතුවම් මඳ වශයෙන් අලුත් වැඩියා කිරීමට භාජන කර ඇති බව දැනට ඇති සායම්වලින් පෙනේ. ඒ නිසා මෙහි ඇති සිතුවම් මූලික වශයෙන් කීර්ති ශ්‍රී කාලයෙහි කරන ලද සිතුවම් වුවත් සහමුලින් මහනුවර සමයේ සිතුවම් සම්ප්‍රදය පිළිබිඹු කරති යි කිය නොහැක. වලල්ගොඩට ආසන්න ඕමල්පේ විහාරයේ සිතුවම් සමග සංසන්දනය කිරීමෙන් මේ වෙනස අවබෝධ කරගත හැක.

ඕමල්පේ විහාරය වලල්ගොඩ කාලයට ම අයත් විහාරයකි. ගෘහ නිර්මානය හා අනික් ලක්ෂන අතින් ද මේ විහාර දෙක ම එක සමාන ය. ඒවායේ බිතු සිතුවම් ද මූලික වශයෙන් එක ම සම්ප්‍රදයකට අයිති වේ. වෙනසකට ඇත්තේ ඕමල්පේ සිතුවම් වලල්ගොඩ සිතුවම් තරම් දිරාපත් වී නැති බව යි. ඕමල්පේ සිතුවම් වලල්ගොඩ සිතුවම්වලට ටික කලකට පසු නිම කරන ලදැයි සිතිය හැක. මේ විහාරය, වලල්ගොඩ විහාරය කරවූ අලහකෝන් මුදියන්සේගේ දෙවෙනි කෘතිය යැයි කියනු ලැබේ.[8] ඇරත් මේ විහාරයට කිසි ම සතුරු උවදුරක් ඇති නොවුන නිසාත්, විහාර ගෙය හොඳින් ආවරනය වී තිබීම නිසාත් එහි සිතුවම් වලල්ගොඩ සිතුවම්වලට වඩා හොඳින් ආරක්ෂා වී ඇත. මේ නිසා පෙනෙන වෙනස ඇරුනු විට මේ විහාර දෙකේ ම සිතුවම් හැම අතින් ම එක සමාන ය. විහාර දෙකේ ම සිතුවම් එක ම සිත්තරෙකු විසින් කරන ලදැ යි සිතීමට තරම් ඒ සිතුවම්වල හැම ලක්ෂනයක් ම එක ම ශෛලියකට අයත් ය.[9]

වලල්ගොඩ හා ඕමල්පේ විහාර දෙකේ ම විහාරගෙයි සැලැස්මත්, බිතු සිතුවම් හා පිලිම ආදිය ප්‍රස්ථාපනය කර ඇති ආකාරයත් බිතු සිතුවම්වලට විෂය වූ වස්තු ආදියත් ඒ විහාර දෙකේ සම්බන්ධය මනාව පිලිබිඹු කර පෙන්වයි. මේ සමාන බව වලල්ගොඩ හා ඕමල්පේට පමනක් සීමා වූවක් ද නොවේ. සබරගමුවේ විහාර කීපයක ම දිටිය හැකි මේ සමානබව නිසා සබරගමු සිතුවම්වල ඇති විශෙෂ අංග කීපයක් ඉස්මතු වී පෙනෙන බව සඳහන් කල යුතු ය.

5. මේ පිළිබඳ විස්තරය 1960 දී අපි දුටු ආකාරයට යි.
6. පණ්ඩිත කිරිඇල්ලේ ඤානවිමල හිමි ස. පැ. ලි. 169
7. එම. 171
8. පණ්ඩිත කිරිඇල්ලේ ඤානවිමල හිමි 174
9. වලල්ගොඩ සිතුවම් පසු කාලයක දී මඳ වශයෙන් ප්‍රතිසංස්කරනය කර ඇති නිසා, ඒවායේ සායම් පිලිබඳ වෙනසක් ඇතැ යි කිය යුතු ය.



ඕමල්පේ
විහාරයක
බිතුසිතුවම්



සබරගමු විහාරවලට විශෙෂ වූවක් හැටියට සැලකිය හැකි එක් අංගයකි, ඇතුල්වන ප්‍රධාන දොරටුවට උඩින් නිරූපනය කර ඇති මෛත්‍රී බෝධිසත්ව විමානය. වෙන ප්‍රදෙශවල මෛත්‍රී දෙව විමානය විහාරගෙයි ඇතුල් බිත්තියකට නියමිත වූවකි. වලල්ගොඩ හා ඕමල්පේ (සාමාන්‍යයෙන් වෙන ප්‍රදෙශවල මකර තොරනට නියමිත නැත) ඇති මේ දෙව විමානය විහාරයට ඇතුල් වන සැදැහැවතුන්ගේ චිත්තප්‍රසාදය ඇති කරනු පිණිස නිරූපනය කර ඇතැ යි සිතිය හැක. චිත්‍රයේ මැද කොටසෙහි දෙවවිමානය අභ්‍යන්තරයෙහි දෙව ලීලාවෙන් සිටින දෙවපුත්‍රයා ද ඔහු දෙපසින් චාමරධාරී දිව්‍යස්ත්‍රීන් ද නිරූපනය කර ඇත. දෙව විමානයේ අභ්‍යන්තරය පරසතු මල්වලින් අලංකාර කර ඇති අතර දෙව රූපයේ පසුබිම කලු පැහැයෙන් පුරවා බෙහෙවින් පියකරු, මල් බරින් නැමී ආරුක්කුවක ආකාරයෙන් දෙව රූපය දෙපසින් කඩා වැටෙන, පිච්චමල් රටාවෙන් නිමවා ඇත. මේ දිව්‍ය විමාන චිත්‍රය මේ විහාර දෙක් චිත්‍ර අතුරෙන් විශෙෂයෙන් ම සඳහන් කල යුත්තකි. එසේ ම වැදගත් තවත් චිත්‍රයක් නම් ඕමල්පේ විහාරයේ දෙරේ ඇඳ ඇති අලංකාර පොල් මල යි. පුන්කලසක බහා ඇඳ ඇති මේ පොල්මලින් භාගයක් පමන අතට ම මැකී ගොස් ඇතත් එහි ඇති කලාත්මක බව වටහා ගැනීම දුෂ්කර නොවේ. එය ඉතාමත් දක්ෂ සිත්තරෙකුගේ කෘතියක් යැයි නොමසුරුව සඳහන් කල යුතු ය.

අතිශයින් කුඩා වූ මේ විහාර ගෙවල ඇතුල ද සකස් කර ඇත්තේ එක හා සමාන සැලැස්මකට අනුව ය. විහාරයට ඇතුල් වන විට ම ලංකාවේ හැම විහාරයකම ඇති සාමාන්‍ය පුරුද්ද හැටියට පිටුපස බිත්තියට පිට දී සිටින වැඩිහිටි පිලිමය ඇත. මේ විහාරවල මූර්තියක් වශයෙන් ඇත්තේ මෙපමන ය. අනිත් හැම දෙයක් ම බිතු සිතුවම් ය. බුදු පිලිමය දෙපසින් පසු පස බිත්තියේ සාරිපුත්ත රහතන් වහන්සේ සහ මුගලන් රහතන් වහන්සේ නිරූපනය කර ඇත. දෙපස බිත්ති දෙකේ උසින් භාගයක පමන තෙක්, විෂ්නු, මහේශ්වර, බ්‍රහ්ම (?), ශක්‍ර (?), සමන්, ගනදෙවි ආදී දේව රූප නියමිත වාහන හා චිහ්න ඇතුව පෙන්වා ඇත. එයින් උඩ බිත්ති කොටසෙහි නිරූපනය කර ඇත්තේ රහතුන් වහන්සේලාගේ රූප ය. විහාරයට ඇතුල් වූවාට පසු දෙරේ දෙපැත්තෙන් සක් පිඹින්නන් දෙදෙනෙකුගේ රූප ඇඳ ඇත. විහාරයේ ඇතුලේ සිලිම සම්පූර්නයෙන් ම මල් මෝස්තර හා භක්තිච්ඡෙද නමින් හැඳින්විය යුතු මල් මෝස්තර හා ජ්‍යාමිතීය මෝස්තරවලින් කල වියනකින් නිමවා ඇත. විහාරය ඇතුලෙහි ඇති ප්‍රධාන සිතුවම් මෙපමන ය. හැම විහාරයක ම දක්නට ඇති, එසේ ම මහනුවර යුගයේ බිතු සිතුවම්වල අගය රඳා පවතින විශිෂ්ට අංගය වූ, ජාතක කතා ඇඳ ඇත්තේ බිත්තිවල පිටපැත්තේ ය. වෙස්සන්තර, දහම්සොඬ සහ ක්ෂාන්තිවාදී ජාතක තුන වලල්ගොඩ විහාරයේත්, දෙවධම්ම, වානර හා දහම්සොඬ ජාතක තුන ඕමල්පේ විහාරයේත් පිටබිත්ති තුනක ඇඳ ඇත. චිත්‍රගත ප්‍රධාන විෂයයන් හැටියට ගිනිය යුත්තේ මෙපමන ය.

සබරගමු ප්‍රදේශයේ ඇති පැරනි ම චිත්‍ර නමුත් මේ බිතු සිතුවම් කලාත්මක අතින් නුවර යුගයේ වෙන තැන්වල ඇති සිතුවම් තරම් අගනේ යැයි කිය නොහැක. විහාර දෙකේ ම පිටබිත්තිවල සිතුවම් දිරාපත් වී ඇති නිසා ආරම්භයේ දී ඒවා නිමකර තිබුනේ, කෙසේ දැයි සිතා ගැනීම අපහසු ය. ඕමල්පේ සිතුවම් තරමක්වත් ආරක්ෂා වී ඇතත් බොහෝ දුරට ඉතිරිවී ඇත්තේ මූලික රේඛා පමනකි. ආරම්භයේ දී තුබුනු සායම්වලින් දැනට ඉතිරිව ඇත්තේ තැනින් තැන පසුබිම පිරවීමට ආලෙපනය කරන ලද කලු පැහැය සහ රතු පැහැයත් පමන ය. මිනිසුන්ගේ ඇඳුම්වල ඉතිරිවී ඇති කොටස්වලින් මුලින් තුබුනු වර්න සංකලනය ගැන අදහස් මාත්‍රයක් ලබාගත නොහැක්කේ ද අමාරුවෙනි. සිතුවම් මෙපමන දිරාපත් වීමට ප්‍රධාන හේතුව හැටියට සඳහන් කල යුත්තේ සායම් සකස් කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමයේ යම් යම් දුර්වල කම් යැයි සිතිය හැක. රජවරුන්ගේ දයකත්වය නොතිබුන ප්‍රාදේශික විහාරවල සායම් ආදිය නියම ක්‍රමානුකූල ව සකස් නොවීම පුදුමයක් නොවේ. හැරත්, රජවරුන්ගේ සහාය ලැබූ විහාරවල මෙන් උසස්, දක්ෂ සිත්තරුන්ගේ සේවය කුඩා විහාරවලට ලබාගන්නට ද නොහැකි වූවා විය හැක. මේ හේතුවෙන් සායම් කලවම් කිරීම් ආදිය නියම ශාස්ත්‍රානුකූල ව කෙරුනේ නැතැ යි කිව යුතු ය. දැනට ඉතිරිවී ඇති සායමේ සිහින්කමත් දිය සායම් හා සමාන ස්වභාවයත් නිසා මේ අදහස තහවුරු වෙයි. ඕමල්පේ විහාරයේ ඇතුල් බිත්තිවල සිතුවම් ආරක්ෂා වී ඇතත් ඒ වායේ ද සායම් එතරම් හොඳින් සකස්කර ඇති බවක් කිය නොහැක.

සායම් පමනක් නොව චිත්‍ර ශෛලිය ද මහනුවර සමයේ ප්‍රසිද්ධ විහාරවල පමන උසස් යැයි කීම අපහසු ය. උස මහත සංකලනය හා කඩවසම අතින් මිනිස් රූප එතරම් කලාත්මක නොවුනත් ඕමල්පේ ඇති සමහර සත්ව රූප හා පිච්ච මල් මෝස්තර සැලකිල්ලට භාජන විය යුතු යැයි හැඟේ. චමත්කාර ජනක අන්දමින් නිරූපනය කර ඇති සත්ව රූප අතර ඊශ්වර වාහනය වූ ගොනා, විෂ්නු වාහනය වූ ගරුලා ද සඳහන්



ඕමල්පේ
විහාරයක
බිතුසිතුවම්





කල යුතු ය. මහනුවර චිත්‍ර සම්ප්‍රදයේ බෙහෙවින් දක්නට නොලැබෙන ගනයේ අගනා ගිරා රූපයක් ද මෙහි ඇත. තවත් විශේෂයෙන් සඳහන් කල යුත්තකි. ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවේ ආසනයෙහි කොනක ඇඳ නිබෙන පුන්කලසක් අතින් ගත් ස්ත්‍රී රූපය. මේ ස්ත්‍රී රූපයේ තේරුම කුමක් ද යි නිශ්චය වශයෙන් කිය නොහැක. මහනුවර යුගයේ සිතුවම්වල මෙ වැනි රූපයක් දක්නට ලැබෙන්නේ මාරයුද්ධය නිරූපනය කිරීමේ දී පමනකි. ඒ අවස්ථාවේ මිහිකත දෙස්දුන් ආකාරය පිලිබිඹු කිරීමට පුන්කලසක් අතින් ගත් ස්ත්‍රියකගේ උඩුකය නිරූපනය කිරීම සාමාන්‍ය සිරිතයි. මහනුවර චිත්‍ර සම්ප්‍රදයට අනුකූල මාරයුද්ධයක් ඕමල්පේ නැත. ඒ නිසා බුද්ධත්වය ලැබීම පිළිබිඹු කිරීම පිනිස ප්‍රධාන බුදු පිලිමයත් මේ පුන්කලස ගත් ස්ත්‍රී රූපයත් උපයෝගි කර ගත්තේ ද යි සිතිය හැක.

වලල්ගොඩ හා ඕමල්පේ සිතුවම්වල දක්නට ඇති තවත් සැලකිය යුතු අංගයක් හැටියට සඳහන් කල යුත්තකි ඊශ්වර විෂ්නු ආදී දේව රූප එකිනෙකින් වෙන් කොට ඇති ආකාරය. දූලේ ඇතුල් බිත්ති දිගට ම පේලියට ඇඳ ඇති සෘජ්වාගත[10] දේව රූප වෙන්කොට ඇත්තේ හැම රූපයක ම දෙපසින් ඇඳ ඇති කනු දෙකක් මගිනි. ඒ කනු දෙකත් ඒවායේ පේකඩ මත නිරූපනය කර ඇති වහලත් නිසා මේ දෙවිවරු තම තමන්ගේ විමානාභ්‍යන්තරයෙහි සිටින බව හැඟෙයි. මෙය සබරගමුවේ සිතුවම්වලට ම සීමා නොවුනක් නමුදු ඒ කනු උසුලාගෙන සිටින වාමන රූප සාමාන්‍යයෙන් මහනුවර යුගයේ සිතුවම්වල දක්නට නොලැබේ. මේ වාමන රූප සිංහල චිත්‍ර හා මූර්ති සම්ප්‍රදයේ විරාගත හෙරව රූපවලින් ම හින්න වූවකැ යි සිතිය හැක.

10. අභිමුඛව පෙනී සිටින අයුරු ඇඳි රූප සෘජ්වාගත යන්නෙන් සංස්කෘතයේ හඳුන්වනු ලැබේ.

